## 169 – පිපස නිවා ගන්න

පිපස නිවා ගන්න අපට ඔබේ ලෙය ලැබේ
හදට අහර ලෙස අගනා සිරුර’පට ලැබේ
සවස දිවා රැයේ තිබෙන පූජේ සුදු ඔබේ
එළිය ලොවට බෙදන ලෙසට යදි අද සබේ

සුරිඳු දෙව්ඳුනී තිලෝ රජිඳුනී
පෙමක මහිමෙනී අපට ඔබ දුනී

නිවන ගන්න ලෙස ඔබ පැමුණුන විට හදට
දවන හදේ පෙම්ගිනි නොහැකිය නිවන්නට
කවන අහර දුබල දනට නිතර ලබනට
පවන දිගේ එවනු සවිය නපුරෙ සටනට

නිවස ඔබේ රුවට පෙනේ මිනිස’ප අතරේ
දවස අපේ ඔබ ලැබුනිත් ආසිරින් පිරේ
පහස දැනේ සතුට ලැබේ ඔබතුම ඇසුරේ
විගස අනේ සරණේ ඔබේ දෙන්න අප කෙරේ

ඔබට එක්ව සදා සැපත ලබා ගනිම්නා
සතුට මුසුව හද තුල ඔබ ලබා නිති දිනා
සැමට ඔබේ දෙව් විමනේ සැපත පතම්නා
එන්න පිහිට සුහඳ සමිඳ දෙන්න සැම දිනා